ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

**පුවත්පත් නිවේදනය**

<u>ඉන්දියානු රජයේ ප්‍රදානයක් යටතේ සිංගල් කැබ් රථ 134ක් ශ්‍රී ලංකා පොලිසියට භාර දෙයි</u>

අද දින පැවති උත්සවයකදී, ඉන්දිය මහ කොමසාරිස් අතිගරු සන්තෝෂ් ජා මැතිතුමා ඉන්දිය රජයේ ශ්‍රී ලංකා රුපියල් මිලියන 300ක ප්‍රදානයක් යටතේ සිංගල් කැබ් රථ 134ක් ශ්‍රී ලංකා පොලිසියට භාර දුන්නේය. මෙම අවස්ථාවට ශ්‍රී ලංකා ජනාධිපති අතිගරු අනුර කුමාර දිසානායක මැතිතුමා ද සහභාගී විය.

2. විශේෂයෙන්ම අභියෝගාත්මක භූමි ප්‍රදේශවල ප්‍රවාහන පහසුකම් ශක්තිමත් කිරීම, මෙහෙයුම් කාර්යක්ෂමතාවය ඉහළ නැවීම සහ ප්‍රතිචාර කාලය අඩු කිරීම මෙම කැබ් රථ ලබා දීමේ අරමුණ වන අතර එමගින් සමස්තයක් වශයෙන් නීතිය සහ සාමය පවත්වාගෙන යාම ශක්තිමත් කිරීමට ද ශ්‍රී ලංකා පුරවැසියන්ගේ සුරක්ෂිතතාවය සහ සුව පහසුව ඉහළ නැංවීමට ද අපේක්ෂා කෙරේ.

3. ශ්‍රී ලංකා පොලිසියේ ඉල්ලීම පරිදි සිංගල් කැබ් රථ සැපයීම සඳහා වන අවබෝධතා ගිවිසුමකට 2025 ජනවාරි මාසයේදී අත්සන් තබන ලදී. මෙය 2024 දෙසැම්බර් මාසයේදී ජනාධිපති අතිගරු අනුර කුමාර දිසානායක මැතිතුමා විසින් සිදු කරන ලද නිල ඉන්දිය සංචාරයෙන් අනතුරුව ගන්නා ලද මුලපිරීම් කිහිපය අතරින් එකකි. මෙම සංචාරය අතරතුර දී එතුමා සහ ඉන්දිය අග්‍රාමාත්‍ය ශ්‍රී නරේන්ද්‍ර මෝදි මැතිතුමා විසින් ඉන්දියාවේ සංවර්ධන සහය ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික වර්ධනයට පරිවර්තනීය බලපෑමක් සිදු කරන බවට එකඟ වූ අතර නායකයන් දෙපෙළ ප්‍රධාන ක්ෂේත්‍රයන් හි ජනතා කේන්ද්‍රීය සංවර්ධන හවුල්කාරිත්වය තවදුරටත් වර්ධනය කිරීමට ද එකඟ වූහ.

4. ශ්‍රී ලංකා පොලිසියේ භාවිතය සඳහා සිංගල් කැබ් රථ සැපයීම සඳහා වන යෝජනාව ජනාධිපති අතිගරු අනුර කුමාර දිසානායක මැතිතුමා විසින් 2025 ජනවාරි මස සමාරම්භ කරන ලද "ක්ලීන් ශ්‍රී ලංකා" මෙහෙයුමේ දැක්වෙන මාර්ග ආරක්ෂාව, කරදරයට පත් පුරවැසියන්ට කාලීන සහය ලබා දීම සහ නීතිය සහ සාමය පවත්වාගෙන යාම යන අරමුණු හා සමපාත වේ.

5. කැබ් රථ භාර දීමේ උත්සවය අද දින ජනාධිපති ලේකම් කාර්යාලයේදී පැවති අතර ඒ සඳහා මහජන ආරක්ෂත සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍ය ගරු කේ. එම්.

ආනන්ද විජේපාල; මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු නියෝජ්‍ය අමාත්‍ය ගරු සුනිල් වටගල; අමාත්‍යාංශ ලේකම් ඩී. ඩබ්. ආර්. බී. සෙනෙවිරත්න; පොලිස්පති ප්‍රියන්ත වීරසූරිය යන මහත්වරු සහ නියෝජ්‍ය පොලිස්පතිවරුන් ඇතුළු ශ්‍රී ලංකා පොලිසියේ නිලධාරීන් සහ ජනාධිපති ලේකම් කාර්යාලයේ සහ මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් ද සහභාගී වූහ.

6. මෙම කැබ් රථ භාර දීම යටිතල පහසුකම්, ප්‍රවාහන, සෞඛ්‍යය, අධ්‍යාපනය, කෘෂිකර්මාන්තය, ධීවර සහ ප්‍රජා සංවර්ධනය වැනි ප්‍රධාන ක්ෂේත්‍ර රැසක් ආවරණය කරන ඉන්දියා - ශ්‍රී ලංකා සංවර්ධන හවුල්කාරිත්වයේ වැදගත් පරිච්ඡේදයක් සනිටුහන් කරයි.

***

**කොළඹ**

***2026* මැයි *25***